# CENTRE FOR MONITORING ELECTION VIOLENCE

# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය

# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

**No:** 24/2, 28th Lane, Off Flower Road, Colombo 07
**Tel:** +94 11 2565304 – 6, 5552746, 5552749, **Fax:** +94 114714460
**E-mail:** cmev@cpalanka.org **Website:** www.cpalanka.org


**උතුරු පළාත් සභා මැතිවරණය 2013**

**2013 සැප්තැම්බර් 21 දා**

**ඡන්දය විමසීම සමාප්තිය. පැය 16.00**

පෙර මැතිවරණයන් සමග සැසඳු කල උතුරු පළාත් සභා මැතිවරණයේ ඡන්දදායක සහභාගිත්වය සාපේක්ෂව ඉහළ මට්ටමක විය. මැතිවරණ දිනයේ දී වාර්තා වූ සිද්ධීන් සංඛ්‍යාව එතරම් ඉහළ නොවුව ද මැතිවරණ දිනයේ සහ මැතිවරණ ව්‍යාපාර සමයේ දි සිදු වූ මැතිවරණ අක්‍රමිකතාවයන් හා නීති උල්ලංඝනයන් කිරීම් ගණනාවක් මගින් මැතිවරණ ක්‍රියාදාමයෙහි නිදහස් හා සාධාරණ ස්වභාවයට බරපතල හානි පැමිණුනි. මැතිවරණ දිනයේදී ගිනි තැබීම්, පහරදීම් හා බියවැද්දීම් ඡන්දදායකයන් ප්‍රවාහනය කිරීම් සහ මැතිවරණ ව්‍යාපාරයේ යෙදීම් සහ මැතිවරණ නිරීක්ෂකයකුට පහරදීමක් ඇතුළු නීති උල්ලංඝනයන් ගණනාවක් සිදුවිය. මැතිවරණ ව්‍යාපාර කාලය තුළ රාජ්‍ය දේපල අයුතු ප්‍රයෝජනය, ඉහළ මට්ටමක වූ සන්නද්ධ හමුදාවන් රඳවා තැබීම් සහ ඔවුන් රජයට පක්ෂව මැදිහත්වීම් සිවිල් ඇඳුමින් සැරසුණු හඳුනා නොගත් කණ්ඩායම් විසින් රජයට විරුද්ධ දේශපාලන පක්ෂ කණ්ඩායම් හා ඡන්ද දායකයන් බියවැද්දීම වැනි ප්‍රධාන ගැටළු ගණනාවක් මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (මැ.ප්‍ර.නි.ම- CMEV) විසින් අවධාරණාත්මකව පෙන්වාදීමට යෙදිනි.

මැතිවරණ දිනයේ දි මැ.ප්‍ර.නි.ම.ය විසින් එක් එක් ඡන්ද කොට්ඨාශයන්හි යෙද වූ මැතිවරණ නිරීක්ෂකයන් 240 දෙනකු හා ඊට අමතරව ක්ෂේත්‍ර නිරීක්ෂකයන් 17 දෙනකු හා ජංගම නිරීක්ෂක ඒකකයන් 8 ක් ද යොදවනු ලැබිණි. සියළු මැ.ප්‍ර.නි.ම. වාර්තාවන් හා පුවත් නිවේදනයන් සහ මැ.ප්‍ර.නි.ම සිදුවීම් ගූගල් සිතියම වෙත http://cmev.wordpress.com ඔස්සේ අන්තර්ජාලය තුළින් ප්‍රවේශ විය හැකිය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) නිදහස් මාධ්‍ය ව්‍යාපාරය (FMM) හා දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි සංධානය එක්ව 1997 දී මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) පිහිටුවා ගනු ලැබුවේ ස්වාධීන හා පක්ෂ වාදීත්වයෙන් තොරවූ සංවිධානයක් ලෙස මැතිවරණ හා සම්බන්ධව ප්‍රචණ්ඩක්‍රියා සිදුවීම් නිරීක්ෂණය කිරීම සඳහාය. වර්තමානයේ මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය(CMEV ) සමන්විත වන්නේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) නිදහස් මාධ්‍ය ව්‍යාපාරය හා (INFORM) ඉන්ෆෝර්ම් මානවහිමිකම් ප්‍රලේඛන මධ්‍යස්ථානය යන සංවිධාන වලිනි.

**මධ්‍යහන 12 සිට පස්වරු 4.00 දක්වා මැ.ප්‍ර.නි.ම.ය විසින් වාර්තා කරන ලද ප්‍රධාන සිදුවීම් ලැයිස්තුව:**

**අසබාල්පුරම් රජයේ දෙමළ මිශ්‍ර පාසලේ අංක 01 ඡන්ද මධ්‍යස්ථානයේ සිට කි.මී. 5 ක් පමණ දුරින් මුලතිව් දිස්ත්‍රික්කය ,මුලතිව් මැතිවරණ කොට්ඨාශය**

අද පස්වරු 2.30 සිට පස්වරු 3.00 අතර කාලය තුළ ඉලංගයි තමිල් අරසුකච්චි (ATTAK) පක්ෂයේ ඡන්ද පොළ නියෝජිත අඩයිකප්පාල් පුබාලන්ගේ හා ඔහුගේ බිරිඳ වන නාටාගම් ඡන්ද මධ්‍යස්ථානයට අනුයුක්ත වන පැෆ්රල් (PAFFRAL) මැතිවරණ දින නිරීක්ෂිකා පුබාලන් ඉන්ද්‍රා යන අයගේ නිවස සම්පූර්ණයෙන්ම ගිනි තබා විනාශ කරනු ලැබිණි.

ඔවුන්ගේ නිවස පිහිටා තිබුණේ මුලතිව්හි අසබාල්පුරම් රජයේ දෙමළ මිශ්‍ර විදුහලේ ඡන්ද මධ්‍යස්ථානයේ සිට කි.මී. 5 ක් දුරින් පිහිටි පලිනගර්හි ය. මෙම සිදුවීම වන අවස්ථාවේ ඔවුන් දෙදෙනාම නිවසින් බැහැරව සිට ඇත. එමෙන්ම වයස 8 ක් 13 ක් සහ 14 ක් වූ ඔවුන්ගේ දරුවන් තිදෙනා ද සිද්ධිය ඇතිවූ අවස්ථාවේ නිවසේ සිට නැත. මීට ගොදුරු වූ අසයි කප්පාල් පුබාලන් කියා සිටියේ මෙම සිද්ධිය සංවිධානය කොට ක්‍රියාත්මක කරනු ලැබ ඇත්තේ එක්සත් ජනතා නිදහස් සන්ධානයෙහි (UPFA) මුලතිව් දිස්ත්‍රික් අපේක්ෂක අඩසිමම් කනගරත්නම් යන අයගේ ආධාරකරුවන් විසින් බවයි. මීට ගොදුරු වූ අය කියා සිටින්නේ තමා ඉ.ත.අ.ක. (ITAK) පක්ෂයේ ඡන්ද පොල ඒජන්තවරයෙකු බැවින් ඔවුන් මෙය සිදු කොට ඇති බවයි..

ද.ජා.සං (TNA) ආධාරකරුවෙකු වූ රතිස් මහතා විසින් මැ.ප්‍ර.නි.ම නිරීක්ෂකයකු වෙත දැනුම් දුන්නේ අමාපුරම් රත්නරාජා, වන්නිවිලාන්කුලම්හි කේ.ක්‍රිෂ්ණකුමාර් සහ කෝලවිලාම්කුලම් හී බ්‍රින්ධා නැමති අයවළුන් විසින් තමන්හට තර්ජනය කරනු ලැබූ බවය. එම වූදිතයන් සියලු දෙනාම මුලතිව් දිස්ත්‍රික්කයේ එ.ජ.නි.ස (UPFA)අපේක්ෂක අඩසිවම් කනගරත්නම්ගේ ආධාරකරුවන්ය. අඩයකාප්පාල් පුබාලන් කියා සිටින්නේ මෙම තර්ජන නිසා මෙම ප්‍රහාරය සංවිධානය කොට ක්‍රියාත්මක කරනු ලැබ ඇත්තේ මුලතිව් දිස්ත්‍රික්කයේ එ.ජ.නි.ස අපේක්ෂක අඩ සිවම් කනගරත්නම් ගේ ආධාරකරුවන් විසින් වන බවයි.

**අංක 05 තිරුනෙල්වේලි මුතු තම්බි මහ විද්‍යාලය, ශාලා අංක 02 ඡන්ද මධ්‍යස්ථානය යාපනය දිස්ත්‍රික්කය, නල්ලූර් ඡන්ද කොට්ඨාශය**

නල්ලූර් ප්‍රාදේශීය සභාවේ සභාපති ද.ජා.සං.(TNA) ප්‍රාදේශිය සභා මන්ත්‍රී (නල්ලූර් ප්‍රාදේශීය සභාව) සෙල්වරාජා කජේන්ද්‍රන් මහතාට මහෙන්ද්‍රා ජීපි රථයකින් ඡන්ද මධ්‍යස්ථානයට පැමිණි පොලිස් නිලධාරියෙකු ( අංක 862757) විසින් පහර දී ඇත. මෙම සිද්ධිය සිදුවූයේ ඔහු තම ඡන්දය පාවිච්චි කොට පස්වරු 1.30 ට පමණ ඡන්ද මධ්‍යස්ථානයෙන් පිටතට පැමිණෙන විටදීය. ඔහුට මෙම ප්‍රහාරයෙන් තුවාල සිදුවී නැත.

**අංක 19 කි./ ශාන්තපුරම් කලයිමගල් විද්‍යාලය, කිලිනොච්චි දිස්ත්‍රික්කය, කිලිනොච්චි මැතිවරණ කොට්ඨාශය**

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ශාන්තපුරම් කලයිමගල් විද්‍යාලය ඡන්ද මධ්‍යස්ථාන අංක 19 ආසන්නයේදි ප.ව. 2.00ට පමණ නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ව්‍යාපාරයේ (CAFFE) මැතිවරණ දින නිරීක්ෂයකු වු එන්. ගුණරාසා හට පහර දෙනු ලැබ ඇත. ඔහු දැනට කිලිනොච්චි රෝහලේ වාට්ටු අංක 06 ප්‍රතිකාර ලබමින් සිටී. මැ.ප්‍ර.නි.ම.ය (CMEV) කැෆේ (CAFFE) ප්‍රකාශක කීර්ති තෙන්නකෝන් මහතා ඇමතු විට ඔහු කියා සිටියේ එම සිද්ධියේ ප්‍රහාරකයා ලෙස ඊ.පී.ඩී.පී. පක්ෂයේ ක්‍රියාකාරිකයකු වන ඉන්ද්‍රන් නැමැත්තා හඳුනාගෙන ඇති බවයි.

**අංක 38 මරුතන්කර්නි හින්දු දෙමළ මිශ්‍ර පාසල, යාපනය දිස්ත්‍රික්කය, පේදුරු තුඩුව ඡන්ද කොට්ඨාශය, මරුතන්කර්නි**

පෙ.ව 11.00 ට මැ.ප්‍ර.නි.ම නිරීක්ෂකයකු වාර්තා කර සිටියේ ඡන්දය දීමට පැමිණෙමින් සිටි පුද්ගලයන්ගේ මග අවහිර කොට ඊ.පී.ඩී.පී. පක්ෂයේ ආධාරකරුවන් එ.ජ.නි.සං.ට ඡන්දය දෙන ලෙස කියා සිටින බව පොයින්ට් පේදුරු ප්‍රාදේශිය සභාවේ ද්‍රවිඩ ජාතික සන්ධානයේ මන්ත්‍රිවරයෙකු හා එම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද වන පි.සංජීවන් පැමිණිලි කොට සිටි බවය. ඡන්දය ප්‍රකාශ කිරීමට මරුතන්කර්නි හින්දු දෙමළ මිශ්‍ර විද්‍යාලයේදී සිදුවෙමින් පවතින අතරතුර ඊ.පී.ඩී.පී./එ.ජ.නි.ස (UPFA) ආධාරකරුවන් ඡන්ද මධ්‍යස්ථානයට යන මාර්ගය දෙපැත්තෙන්ම අවහිර කරමින් ජනතාවට තර්ජනය කරමින් සිටියහ. මේ ඡන්ද මධ්‍යස්ථානයේ පොලීසිය රාජකාරියේ යෙදී සිටි නමුත් තත්ත්වය පාලනය කිරීමට කිසිදු පියවරක් ගෙන නැත ඡන්දදායකයන් කියා සිටියේ තමන්ට තර්ජනය කළ කණ්ඩායම බිමත්ව සිටි බවයි.ඉල්ලවායි අංක 21.

**ඉල්ලවායි මෙහන්දන් මහ විද්‍යාලය ඡන්ද මධ්‍යස්ථානය, යාපනය දිස්ත්‍රික්කය, කන්කසන්තුරෙයි ඡන්ද කොට්ඨාශය**

මැ.ප්‍ර.නි.ම.යේ මැතිවරණ නිරීක්ෂකයකු හට වාර්තා වු අන්දමට පෙ.ව 10.30 ට හා ප.ව 12.30 ට අතර කාලය තුළ සිවිල් ඇඳුමෙන් සැරසුණු හමුදා නිලධාරීන් සහ අළුතින් බඳවාගනු ලැබූ සමෘද්ධි නිලධාරීන් පිරිසක් කන්කසන්තුරෙයි, ඉල්ලවායි අංක 21 ඡන්ද මධ්‍යස්ථානය අසල ඡන්දය ඉල්ලා සිටිමෙහි යෙදී සිට ඇත. යාපනය දිස්ත්‍රික්කයේ එ.ජ.නි.ස. අපේක්ෂක (අපේක්ෂක අංක 01) අංගජන් රාමනාදන් මහතාට ඡන්දය ලබාදෙන ලෙස ඔවුන් ඡන්දදායකයින්ගෙන් ඉල්ලා ඇත.

**අල්අක්සා මහ විද්‍යාලයම් අසල අංක 14 ව/අල්අක්සා මහ විද්‍යාලය චලම්බායිකුලම් ඡන්ද මධ්‍යස්ථානය වව්නියාව දිස්ත්‍රික්කය, වව්නියාව මැතිවරණ කොට්ඨාශය**

මැ.ප්‍ර.නි.ම නිරීක්ෂකයකු විසින් වාර්තා කොට සිටි පරිදි ප.ව. 12..15 ට පමණ ලියාපදිංචි අංක 58-7007 දරණ වෑන් රථයෙන් ඡන්ද දායකයන් පිරිසක් ප්‍රවාහනය කරනු ලැබ ඇත. එම වෑන් රථයෙහි එ.ජ.නි.ස. අපේක්ෂක මුත්තු මොහොමඩ් ( අපේක්ෂක අංක 03) මහතාගේ පෝස්ටර් අලවා තිබී ඇත.

**අංක 47 මන්/ අරිප්පු රෝමාණු කතෝලික දෙමළ මිශ්‍ර පාසල ඡන්ද මධ්‍යස්ථානය**

**මන්නාරම දිස්ත්‍රික්කය, මන්නාරම ඡන්ද කොට්ඨාශය**

දේවරාජ් පියතුමා තම ඡන්දය පාවිච්චි කිරීමට මන්/අරිප්පු ආර්.සී.ටී.එම්.එස්.ඡන්ද මධ්‍යස්ථානයට ගොස් මධ්‍යස්ථානයේ විශාල පිරිසක් සිටි නිසා දේවරාජ් පියතුමා ඇතුළු ඡන්දදායකයන් ගණනාවක් ඡන්ද මධ්‍යස්ථානය අසල නිවෙසකට එකතු වි සිට ඇත.. මෙම ගොඩනැගිල්ලෙහි මැතිවරණ ප්‍රචාරක කටයුතු සිදුවන්නේ ය යන සැකය මත සිලාවතුරෙයි පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා සහ සහකාර පොලිස් අධිකාරිවරයා එසේ ඡදදායකයන් රැස්ව සිටි නිවසට පැමිණ පහරදී ඇත. ඔවුන් තම ඡන්දය පාවිච්චි නොකරන්නේ මන්දැයි පොලිසිය විසින් එහි රැස්ව සිටි පිරිසකගෙන් ප්‍රශ්න කොට ඇත පියතුමා පොලිසිය සමඟ තර්ක කර ඇති අතර පොලිස් නිලධාරියෙකු දේවරාජ් පියතුමා තල්ලු කොට දමා ඔහුගේ සහෝදරයාට පහර දි ඇත. පසුව දේවරාජ්

පියතුමා තම සහෝදරයාට පහර දුන්නේ ඇයි දැයි පොලිසියෙන් විමසූ විට පොලිසිය සමාව ඉල්ලා ඇත. මේ පිළිබඳව පොලිස් පැමිණිල්ලක් සිදු කොට නැත.

**<u>අංක 29 යාපනය සිරුප්පිඩි රජයේ දෙමළ මිශ්‍ර පාසල ඡන්ද මධ්‍යස්ථානය, යාපනය දිස්ත්‍රික්කය,</u>**

**<u>කෝපායි මැතිවරණ කොට්ඨාශය</u>**

පෙ.ව. 7.00 ට පමණ මැ.ප්‍ර.නි.ම. මැතිවරණ නිරීක්ෂකයන් හට දක්නට ලැබුනේ සාමාන්‍යයෙන් සෑම ඡන්ද පෙට්ටියකම ඇලවිය යුතු ස්ටිකර් 3 ක් අලවා නොමැති ඡන්ද පෙට්ටියක් ඡන්ද මධ්‍යස්ථානයේ තිබුණු බවය. ප.ව 2.45 වන විටත් එම ඡන්ද පෙට්ටියේ ස්ටිකර් අලවා නොතිබිණි.

| | | |
|---|---|---|
| ආචාර්ය පී. සරවනමුත්තු | සුනිල් ජයසේකර | උදය කළුපතිරණ |
| සම කැඳවුම්කරු | සම කැඳවුම්කරු | සම කැඳවුම්කරු |